ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

**<u>මහ කොමසාරිස්තුමා අතින් වෛශාලියේ අශෝක ධර්ම ස්තම්භයේ අනුරුවක් නිරාවරණය කරේ</u>**

වස්කඩුව රාජගුරු ශ්‍රී සුභූති මහා විහාරයේ ඉදි කළ වෛශාලියේ අශෝක ධර්ම ස්තම්භයේ අනුරුවක් 2025 ජුලි 21 වන දින ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා නිරාවරණය කරන ලදී.

2. එතුමා විහාරාධිපති අති පූජ්‍ය ආචාර්ය වස්කඩුවේ මහින්දවංශ මහා නාහිපාණන් සමඟ එක්ව විහාරස්ථානයේ පැවැත්වෙන කපිලවස්තු ධාතු ප්‍රදර්ශනය ද විවෘත කළේය. මහා නාමියන්ගේ ජන්ම දිනය වෙනුවෙන් එතුමා උන්වහන්සේට නිදුක් නිරෝගී චිර ජීවනය ද ප්‍රාර්ථනා කළේය.

3. මෙම අවස්ථාව අමතමින්, මහා නාහිමිපාණන් වහන්සේ සඳහන් කළේ මෙය ශ්‍රී ලංකාවේ ඉදි කරන ලද ප්‍රථම අශෝක ස්තම්භය වන බවයි. බුදුන් වහන්සේගේ ඉගැන්වීම් ආරක්ෂා කිරීමෙහි ලා ධර්මාශෝක රජතුමාගේ සුවිශේෂී භූමිකාව පිළිබඳව සිහිපත් කළ උන්වහන්සේ ධාතූන් වහන්සේලා විහාරස්ථානය වෙත වැඩම කරවීමේ ඉතිහාස කතාව ද සැකෙවින් විස්තර කළේය. නා හිමිපාණන් වහන්සේ අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ නායකත්වය යටතේ ඉන්දීය රජය බෞද්ධ උරුමය සුරැකීමට සහ ප්‍රවර්ධනය කිරීමට ගන්නා ප්‍රයත්නයන් බෙහෙවින් අගය කළේය.

4. මෙම අවස්ථාව අමතමින් මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා මෙම සුවිශේෂී අවස්ථාව ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ගැඹුරු ඓතිහාසික, සංස්කෘතික සහ ආධ්‍යාත්මික සබඳතා යළි තහවුරු කරන බව ප්‍රකාශ කළේය. වර්තමානයේදී ශ්‍රී ලංකාව බෞද්ධ ඉගැන්වීම් සහ අධ්‍යාපනය සඳහා ප්‍රමුඛතම මධ්‍යස්ථානයක් වන බව සඳහන් කළ එතුමා බොදු උරුමය දෙරට ජනතාව එකට එක් කරන ශක්තිමත්ම බැඳීමක් බව පැවසීය.

5. මෙම උරුමය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ඉන්දියාව ආසන්න වශයෙන් බෞද්ධ විහාරස්ථාන සහ පිරිවෙන් 10,000කට පමණ නොමිලේ සූර්ය බලය ලබාදීම සඳහා ව්‍යාපෘතියක්, අනුරාධපුර පූජා නගර සංකීර්ණය සඳහා ආධාර ලබා දීම, ඉදිරියේදී පැවැත්වීමට නියමිත දේවනිමෝරි සර්වඥ ධාතූන් වහන්සේලා ප්‍රදර්ශනය, පවත්වන ලද සාරානාත් සහ කපිලවස්තු ධාතූන් වහන්සේලා ප්‍රදර්ශන, ශ්‍රී ලාංකේය බැතිමතුන් සඳහා සංවිධානය කරන ලද විවිධ වන්දනා සහ විශේෂ චාරිකා, බුදුන් වහන්සේගේ ජීවිතය හා සබැඳි ජංගම ප්‍රදර්ශන, නාමාමාලා සහ බාලාවතාරය වැනි ඉපැරණි පාලි ව්‍යාකරණ ග්‍රන්ථ

යළි මුද්‍රණය කිරීම, රට පුරා දහම් පාසල් වෙත සිංහලට පරිවර්තනය කරන ලද ජාතක කතා පොත් බෙදා දීම ඇතුළු විවිධ මුලපිරීම් රැසක් ගෙන ඇති බව ද සිහිපත් කළේය.

***

**කොළඹ**
***2025* ජූලි *22***